ශ්‍රී වික්‍රම රාජසිහ රජු ඉංග්‍රීසින්ට අසු වී වසර 199 යි

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංගිරිසින්ට හසුවීමේ සිද්ධිය පුරාණ පුස්කොළවල සටහන්ව ඇත්තේ මෙසේය.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් තුන්සිය දෙසැට වැන්නෙහි සන්දනංගම සිද්ධාර්ථ උන්නාන්සේ වන මා විසින් ඉංගලන්තේ පරදේශක්කාරයෝ කන්දේ නුවර වටලා යුද්ධ කර රාජසිංහ රජ්ජුරුවෝ අල්ලා ගත්තා කියා පුවක්ගොල්ලේ දහතැන් ගෙදර මොහොට්ටාලගේ අතේ ගුරුන්නාන්සේගේ බාල සහෝදරයාගෙන් (අනෝමදස්සි) ආරංචි උනාය.

රජ්ජුරුවෝ අපේ විහාරයට සමීප පාරෙන් කොලොම්තොටට ගෙනියනවා බලන්ඩ අපේ ගුරුන් වහන්සේ ද මා ද අපේ ගුරුන්නාන්සේගේ බාල සහෝදරයා වන මැණික්රාල මෙහොට්ටාල ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ගේ මාතෘ බිසෝ සාමි වූ සිරියම්මාල් දේවින් වහන්සේගේ හිසේ රුජාවට වෙදකම් කොට වෛද්‍යරත්න යන නාමය පටබැඳගත් පුංචිරාල මොහොට්ටාල ද මැණික්රාල මොහොට්ටාලගේ පහිහිපත් කාරයා වන නවගන්තර රාල ද (කාරියසේකර) කිරියා කියන කින්නර දුරයාද ගියාය.

රජතුමා, බිසෝවරුන් ඇතුළු රාජකීයයන් ගමන් ගෙන ඇත්තේ දෝලාවලිනි. මොහොට්ටාලාගේ ගෙදර ආරක්ෂාවට සඟවා තැබූ රජතුමා සතුවූ කච්චිච් රන් රිදී වාරාගත් කස්ථාන ආදී වටිනා බඩු වර්ග ද ඉංග්‍රීසින් විසින් පැහැරගත් බව දහතැක්ගෙදර මොහොට්ටාල කීවේය. රජ්ජුරුවෝ දෝලාව නවත්වා එහි සිටි පිරිස සමග කථා කර ඇත. රජ්ජුරුවන්ගෙ මවුබිසවුන් දෙන්නාත් කුඩා බිසවුන් දෙන්නාත් ගමන් කළ දෝලා කීපයක්ම ඒ අතර වී තමුත් කිසිවෙකු ජෝන් ඩොයිලි එම පිරිස අතර සිටි බවක් දැක නැත.

රජතුමාට දෝලාවෙන් පිටතට බැසගන්ට බැරිවන අසුරු ඉංග්‍රීසි සොල්දාදුවෝ එක් පසෙක ද අනික් පසින් ඉංග්‍රීසින් කුළියට ගත් සිංහල හේවායෝද මුරකරමින් ගමන් කර ඇත. රජතුමා අත් දෙකද පය ද එළියට දැමූ පසු මැණික්රාල මොහොට්ටාල හා පුංචිරාල මොහොට්ටාල ද රජතුමාගේ අත පය සිඹ ඇඳුවා පමණක් නොවී දෙයියෝ අපෙන් වරදක් වුනානම් සමාවෙන්ට හොඳයි කියා ඇත. මෙහිදී රජතුමා පැවසූ වදන් වලින් සිංහලයම කම්පාවනු නොඅනුමානය.

අයියේ උඹේ වැඩිමහල් සහෝදරයා පුවක්ගොල්ලේ දහතැක්ගෙදර කළිඟුරාළ සට්ටබිරාළ මට විශ්වාසවන්තකම් පා සිට පිළිමතලව්වෙන්, රත්වත්තෙන් එක්ක එකතුව මට ඌරුපා කඩවතදී හදිකළ ගිසාවට හිස ගසා දැම්මාය. උඹලා මට එක්තැලිගොඩ වගේ හදි කළේ නැත. උඹලා යහතින් ජීවත් වෙයල්ලා. මම අාපසු එන්නේ නැත. මින් පස්සේ සිංහලේ රජකෙනෙක් නැති.

රජතුමාට සහෝදරයෙකුට මෙන් විශ්වාසවන්තව සිටි කීප දෙනෙකුගේ නම් මෙහිදී සිහිපත් කර ඔවුන් දිවිහිමියෙන් අමතක නොකරන බව කීවේය. ඔවුන් නම්, ගනන්ගොමුවේ මොහොට්ටාල, මොරගනේ මොහොට්ටාලය. එමෙන්ම රජතුමාට විරුද්ධව ඉංග්‍රීසින්ට උපකාර කළ රජතුමා නෑදෑයින්ට මෙන් සැලකූ පිරිසගේ නම්ද රජතුමා මේ අවස්ථාවෙහි දී සිහිපත් කළේය. ඔවුන් වූයේ කවුඩුමුන්නේ මොහොට්ටාල, කන්දෙගෙදර මොහොට්ටාල, හුරැග්ගමුවේ, යක්කාවිට, උඩුමුල්ලේ, හංවැල්ලේ, මූනමලේ, මිරිහාන්පිටියේ, පතගිවත්තේ හා කලුන්දෑවේ ගම්වල සිටි සමහරුන්ය.

රජතුමා දෝලාවෙන් පිටත්වීමට පෙර එතැන රැස්වී සිටි පිරිසට වැද ආචාර කොට අනෝමදස්සි හිමියන් ලියා දුන් ධම්ම පදය එතුමා ළඟ තිබී මොණරවිලට දුන් බවත් උන්වහන්සේගේ අකුරු මුතු ඇට මෙන් ලස්සන බවද කීවේය. මෙම ධම්ම පදය ද කැප්පෙටිපොල හිස ගසා දමන අවස්ථාවේ බඳුල්ලේ දිසාපති සෝසස්ට දුන්නේ?

එසේම රජතුමා උන්වහන්සේට තෑගි දුන් පන්හිඳ රජතුමාගෙන් සිහිවටනයක් ලෙස තබාගන්නා මෙන්ද ඉල්ලීමක් කළේය. මෙම අවස්ථාව වී ඇත්තේ පිරිස කොළඹ බලා ගමන් ගත් මාර්ගයේ පිහිටි නූතන දඹදෙණියේදීය.

රජතුමා ඇතුළු පිරිස නොපෙනී යන තෙක්ම රැස්ව සිටි පිරිස මහත් ආවේගයෙන් බලා සිට ඇත. මැණික්රාළ මොහොට්ටාල බිම පෙරළි පෙරළි හයියෙන් ඇඩුවේ සිංහලේ දෙයියෝ නැති වුනා ං අපට රජෙක් නැති වුණා, අපි නැති වුණි යැයි විලාප නගමිනි.

මේ අතර පුංචිරාළ වෙදරාළ හැසිරුණේ වෙනත් ආකාරයකටය. ඔහු මැණික්රාළ මොහොට්ටාලටත් බැණ වදිමින් අපිට විත කරපු, දරුවන් කොටවපු වඩිගයා නැතිවුණි යැයි කියමින් එම ස්ථානයෙන් පිටව ගියේය. අවුරුදු දෙදහස් පන්සිය ගණනකට වඩා අපට හිමිව තිබූ රාජත්වයේ අවසානය මෙසේ සනිටුහන් කරමි.

1815 පෙබරවාරි 18 ඉරුදින ඉංග්‍රීසින් විසින් අල්ලාගනු ලදුව රජතුමා 1816 ජනවාරි 24 දින කොන්වෝලිස් නොකාවෙන් වෙල්ලෝරයට ගෙනයන ලදී. 1832 ජනවාරි 30 දින වෙල්ලෝරයේදී මිය යන විට රජතුමාට අවුරුදු පනස් දෙකක් වූ අතර රජු උස අඩි හයයි අඟල් දෙකක්ව කාලවර්ණ සිත්ගන්නාසුලු දේහයකින් යුත් මදුරාසියේ සිටි නායර් නම් නායක්කාර වංශිකයෙකි. රජතුමා මියගොස් ඇත්තේ බඬේ අපිරිණයකිනි.

(පන්නල ඡුමේඩ නාගමියන්ගේ මිවැව විත්හි පොත හා වෙනත් ලේඛන ආශ්‍රයෙහි. ලංකාදීප අනුග්‍රහයෙහි)

හොරණ තක්ෂිලා
මෙල්බර්න් ආදි සිසු සුහද හමුව

දිනය : 2014 මැයි 31 දා

වේලාව : ප ව 6.00 සිට ප ව 10.00 දක්වා

ස්ථානය පසුව දැනුම් දෙන බව කරුණාවෙන් සලකන්න.

තක්ෂිලා ආදි සිසු ඔබ සැමගේ පැමිණීම බලාපොරොත්තු වෙමු

කරුණාකර පහත සඳහන් දුරකතන අංකයක් අමතා ඔබගේ පමිණිම දැනුම් දෙන්න. ඒ සමගම ඔබගේ ලිපිනය හා දුරකතන අංකය අප වෙත ලබා දෙන්න.

නිලන්ති ගමලත් - 0416768298 (A/H)

චන්දන පෙරේරා - 0403962904 (A/H)

චන්ද්‍රකීර්ති කලුබෙව්ල - 0408103190 (A/H)

email : taxilainmelbourne@gmail.com.au

පුංචි කිරිල්ල

''අවසර මහාරාජ, ඔබවහන්සේ දෙසා බාලා තිබුණා
ඔබවහන්සේ ලංකාව පුංචි කළාද කියලා
ඔබවහන්සේටම හිතෙනවා කියලා''
''ඔව් ඉතිං''
''ඔය විදිහට ඔබවහන්සේ ''පුංචි කළා'' කියලා
හිතෙන තවත් දේවල් තියනවාද?''
''බොහෝයි''
''දෙසාබන්නකෝ, පත්තරේට''
''විපක්ෂය, අන්විත්ක්ෂයකින්වත් බලන්න බැරිවෙන විදිහට ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන සයිස් එකට පුංචි කළා''
''තව''
''විපක්ෂය නායකයා පුංචි කළා,
කෝටි කෝප්පයක දාන්න පුළුවන් සයිස් එකට''
''තව''
''අධිකරණය පුංචි කළා,
ජජාල මගේ සාක්කුවේ දාගන්න පුළුවන් සයිස් එකට''
''තව''

''මන්ත්‍රී සංඛ්‍යාව පුංචි කළා,
ඇමැති සංඛ්‍යාවටත් වඩා අඩුවෙන විදිහට''
''තව''

''තොරතුරු දැනගැනීමේ අයිතිය පුංචි කළා,
ඒක ඉල්ලන එවුන්ගේ පහළ මුඛේ ගහගන්න පුළුවන් වෙන සයිස් එකට''
''තව''
''ජනතාවගේ ඩඩවල් පුංචි කළා,
කෑවද නොකෑවද කියලා හොයන්න බැරි වෙන සයිස් එකට''
''තව''

''ඔය විදිහට පුංචි කරලා පුංචි කරලා දැන් 'මුතු ඇටේ' පුංචි වෙලා තියෙන්නේ 'අබ ඇටේ' සයිස් එකට''
''යකාගේ පුංචි කෙරිල්ලක්නේ කොරල තියෙන්නේ''
''යකාගේ නෙවෙයි රජාගේ''

''අපූරුයි මහාරාජ, එතකොට මොකවත්ම ලොකු කළේ නැතෙයි?''
''මොකද නැත්තේ. ලොකු කරන්ඩ ඕනේ ඒවත් ලොකු කළා නනුතෙට''

''වැඩියෙන්ම ලොකු කළේ මොකක්ද මහාරාජ?''
''දන්නෙම නැත්ද? මහාරාජපක්ෂ පුත්‍ර, සහෝදර සහ ඥාති සමාගමනේ.
හොං හොං හොං''

ම.රා. සාදී